# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

අංක. 9,037—1942ක් වූ නොවැම්බර් මස 20 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### උපාංග නීති.

L. D.—B. 269/31

වන්දනා ගමන් පිළිබඳ ආඥාපනතයි.

**කතරගම ඉල්මහ කාච්චි මංගල්‍යය සම්බන්ධ නියෝග.**

වන්දනා ගමන් පිළිබඳ ආඥාපනතේ (133 වෙනි පරිච්ඡේදය) 2 වන වගන්තියෙන් බලය ලත් ප්‍රකාර 1942 ක් නොවැම්බර් මස පවත්වනුලබන ඉල්මහ කාච්චි මංගල්‍යය සම්බන්ධ සිරිත් පරිදි කතරගමට කෙරෙන වන්දනාගමන අරමුණුකොට මෙහි පහත දැක්වෙන නියෝග මෙම දැන්වීම මගින් ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ වන ඇන්ඩෲ කැල්ඩිකොට් නමැති මවිසින් පණවනලදී.

ඒ. කැල්ඩිකොට්,
ලංකාණ්ඩුකාර උතුමාණන්වහන්සේ.

1942ක් වූ නොවැම්බර් මස 15 වෙනි දින
මහනුවරදීය.

**නියෝග.**

1. මේ නියෝග සඳහා "වාඩිය" යයි සලකනුලබන්නේ:—
(අ) කතරගම මහදේවාලයේ සිට සැමදෙසින්ම හැතැප්ම භාගයක් ඇතුළත ප්‍රදේශය; හා
(ආ) සෙල්ල කතරගම පිහිටි පිල්ලයාර් කෝවිලේ සිට හැතැප්ම කාලක් ඇතුළත ප්‍රදේශයද වේ.

2. (අ) කතරගම ඉල්මහ කාච්චි මංගල්‍යය හා කතරගම වන්දනාකාරයින්ගේ නැවතීම පිළිබඳ කාලය මේ 1942 ක් නොවැම්බර් මස 21 වන දින පටන් එම මස 23 වන දින අවසානය දක්වා දවස් 3ක් සීමාකළයුතු බැවින් එය මෙයින් මෙසේ සීමා කරණු ලැබේ.

(ආ) කිසිම වන්දනාකරුවෙක් නොවැම්බර් මස 21 වෙනි දිනට පෙර වාඩියට පැමිණීමද, එම මස 23 වෙනි දිනට පසු වාඩියේ නැවතීමද නොකළ යුතුයි.

3. මෙම වාඩියේ කටයුතු ඌවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගේ සාමාන්‍ය පරිපාලනය පිට හා වෛද්‍ය මූලාදෑනි කෙනෙකුගේ සහ පොලිස් මූලාදෑනියෙකුගේත් ආධාරලත් "ස්ථාන පාලක නිලධාරීතැන" යයි නම්කරණලද මූලාදෑනි කෙනෙකුගේ තීක්ෂණ පරිපාලනය පිටද පවතී.

4. (1) ස්ථානපාලක නිලධාරීතැනට කතරගමදීද කතරගමට යන එන අතරමගදීද, පහත දැක්වෙන නියෝග සැලැස්වීමට බලය තිබේ:—

(අ) සේදීමට හා නෑමටද, වතුර ඇදගෙන බීමටද, ශරීර කෘත්‍යයන් සඳහාද වන්දනාකාරයින්ගේ විශේෂ ප්‍රයෝජනයට විශේෂ ස්ථාන නියමකිරීමටද;

(ආ) එක් එක් වර්ගයේ වන්දනාකාරයින්ට නැවතීමට ස්ථාන නියමකිරීමටද;

(ඉ) යම්කිසි වන්දනාකාර කණ්ඩායමක් විසින් යායුතු මාර්ග නියම කිරීමටද;

(ඊ) වන්දනාකාරයින්ට දෙන සියලුම ආහාර බෙදාදීම හසුරුවීමටද;

(උ) අසනීපවන වන්දනාකාරයින්ගේ ප්‍රයෝජනය පිණිස වාසස්ථාන වෙන්කොට නියමකිරීමටද ඔවුන් සමග ගණුදෙනු කථාබස් තහනම්කිරීමට හා ඔවුන්ට යෑමට නුපුළුවන්නම් නවත්වාගැනීමටද බලය තිබේ.

(2) ස්ථාන පාලක නිලධාරීතැන විසින් මෙහි ඉහත 1 වෙනි වගන්තියට සඳහන් කටයුතු සම්බන්ධව නීතිප්‍රකාර දෙනු ලබන කිසිම නියෝගයකට කිසිවෙක් අකීකරු නොවිය යුතුයි.

5. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ ශරීර කෘත්‍යයන් සඳහා විශේෂයෙන් සලස්වා තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය ස්ථානයක කිසිවෙකු විසින් මලමූත්‍ර පහකිරීම නොකළ යුතුයි.

6. ආණ්ඩුවේ ඒජන්තතුමන් විසින් හෝ එතුමන්ගේ අනුමතය පිට හෝ කුණු කසල දැමීමට සලස්වා තිබෙන භාජනවල හෝ ඒ වෙනුවෙන් වෙන්කර තිබෙන ස්ථානයක හැර වාඩියේ අන්‍ය කිසිම ස්ථානයක කුණු කසල ආදිය නොදැමිය යුතුයි.

7. ස්ථානපාලක නිලධාරීතැන විසින් ගඟේ නෑමට නියම කරණලද ස්ථානයෙහි හැර ඒට ඉහළින් වාඩියට අයිති සීමාව තුළ කිසිවෙකු විසින් ගඟට බැසීම හෝ නෑම හෝ නොකළ යුතුයි.

8. ස්ථානපාලක නිලධාරීතැනගෙන් අවසරපත්‍රයක් නොලබා නැත්නම් එබඳු අවසරපත්‍ර දීමට එකී නිලධාරීතැනගෙන් බලයලත් යමෙකුගෙන් අවසරපත්‍රයක් නොමැතිව වාඩියේ සිට හැතැප්ම කාලකින් ඇතුළට ගවයෙක් හෝ කරත්ත ගොනෙක් ගෙනඒම නොකළ යුතුයි.

9. ඉහත සඳහන් පරිදි අවසරපත්‍ර දෙනුලබන්නේ වාඩිය තුළ රථ වාහන ගමනාදිය සම්බන්ධවද වාඩියේ සනීපය ආරක්ෂාකරගැනීම සම්බන්ධවද ස්ථානපාලක නිලධාරීතැන විසින් පනවනලද නියෝගයන් අවසරපත්‍රලත් අය විසින් ඉෂ්ටකරන පොරොන්දුව පිටය.

10. ඌව දිසාවේ ඒජන්තතුමාගෙන් පළමුවෙන් ලබාගන්නාලද අවසරපත්‍රයක් නොමැතිව කිසිවෙකු විසින් වාඩිය තුළ පාන්ගෙයක් හෝ සිසිල්බීම පෙරණ යන්ත්‍රයක් හෝ තේ හෝ කෝපි කඩයක් හෝ භෝජන ශාලාවක් හෝ ගාලක් නොතැබිය යුතුයි. එවැනි අවසරපත්‍ර නොමිලේ දෙනුලැබේ.

11. (1) වෙළඳාම පිණිස බඩු තැබීම සඳහා ස්ථානපාලක නිලධාරීතැන විසින් වෙන්කර තිබෙන තැනෙක හැර වාඩියේ වෙන කිසිම ස්ථානයක මොනයම් වෙළඳ ද්‍රව්‍යයක් නමුත් වෙළඳාම් පිණිස නොතැබිය යුතුයි.

(2) තවද ස්ථානපාලක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය මූලාදෑනිතැන විසින් හෝ ඔවුන් නැතිතැන පොලීසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් ආහාරයට නුසුදුසුයයි නියමකරනුලබන යම් කෑමවර්ගයක් කිසිවෙකු විසින් නොවිකිණිය යුතුයි.

(3) ස්ථානපාලක නිලධාරීතැන විසින් හෝ වෛද්‍ය නිලධාරීතැන විසින් හෝ එබන්දෙක් නැත්නම් පොලීසියේ ප්‍රධාන නිලධාරීතැන විසින් ආහාරයට නුසුදුසුයයි ප්‍රකාශකරනලද සියලුම ආහාර ද්‍රව්‍ය තහනම්වගෙන විනාශකරදමන්ට පොලීසියේ මූලාදෑනි කෙනෙකුට හෝ සැනිටරි ඉන්ස්පැක්ටර් කෙනෙකුට නීත්‍යානුකූලව බලය තිබේ.

12. (1) භෝජන ශාලාවල්ද, කෝපි සහ තේවතුර කඩද පිරිසිදුව සනීපය ආරක්ෂාවන පරිදි තබාගත යුතුයි.

(2) විකිණීමට තබනලද සියලුම කැවිලි හා රසකෑම ජාතිද, උයනලද කෑම ද්‍රව්‍යයන්ද නිසිආකාර සාදනලද මැස්සන්ට යෑමට නුපුළුවන් වීදුරු පෙට්ටිවල බහා තැබිය යුතුයි.

(3) පාවිච්චිකොට ඉතිරිවන තේ, කෝපි, කිරි හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය බිම එසෙ මෙසෙ නොදමා ඒට සුදුසු මෙහි පහත විස්තරකරණුලබන අන්දමේ භාජනවල එකතුකොට සනීපාරක්ෂාව සඳහා පත්කරණුලැබූ අයවලුන් පැමිණ ගෙනයන තෙක් සෑම වේලාවල්හිම බහා තැබිය යුතුයි.

(4) වෙළෙහෙළඳාම පිණිස සාදනලද ගොඩනැගිලි, මඩු, කොටු ආදී සෑම ස්ථානයකම කුණු රොඩු හැන්පත්කර තැබීම සඳහා ලෝහයෙන් හෝ ලීවලින් සාදනලද ඝන අඩි 4½ කට අඩුනොවන ප්‍රමාණයක භාජනයක් සපයා තබා එම ස්ථානයෙහි රැස්වන කුණු කසල සියල්ලම එම භාජනය තුළ හැන්පත්කර තැබිය යුතුයි. කුණු කසල එහි හැන්පත්කරණ හෝ ඉන් අස්කරණ කාලයන්හි හැර අන්‍ය සෑම වේලාවල්හිම එය ලෝහ හෝ ලී මූඩියකින් වසා තැබිය යුතුයි.

13. බෝවෙන හෝ පැතිරෙන රෝගයකින් පෙළෙන කෙනෙක් කිසිවෙකු විසින් වාඩිය තුළට නොගෙනා යුතුයි. තවද එවැනි රෝගයකින් පෙලෙන කෙනෙකුට වාඩිය තුළට ඒමට කිසිවෙක් අනුබලදීමද නොකළ යුතුයි.

14. උත්සවය පවතිනාතර කතරගම වසංගත රෝගයක් ඇතිවුවහොත් "උත්සවය අවසාන වූයේය" යි ප්‍රකාශකිරීමටද ඒ ගම හැර තමතමන්ගේ ගම්වලට වන්දනාකාරයින්ට වහාම යෑමට අණකිරීමටද, ඔවුන් යායුතු මාර්ග නියමකිරීමටද ආණ්ඩුවේ ඒජන්තතුමාට නීතිප්‍රකාර බලය තිබේ.

15. වාඩියතුළදී යම්කිසිවෙකුට බෝවෙන හෝ පැතිරයන රෝගයක් වැළඳුනහොත් නැතිනම් එවැනි රෝගයකින් පෙලෙන්නේයයි දැන දැනම රෝගියෙක් සමග වාසයකරන්ට යෙදුනොත් ඒ බව වාඩිය ආරක්ෂක වෙද මූලාදෑනිතැනට ඔහු විසින් දැන්විය යුතුයි.

16. වාඩියතුළ වීරියක් ගැටීමට පාවිච්චිකරනුලබන්නාවූ හෝ එසේ පාවිච්චිකිරීම පිණිස වෙන්කරනු ලැබුවාවූ ඉඩමක් අසූචිත පරිදි ආණ්ඩුවේ ඒජන්තතුමාගෙන් පළමුවෙන් අවසරයක් නොලබා කිසිවෙකු විසින් කිසිම වලක් සෑදීම හෝ තිබෙන පොඩතැගිල්ලක් විශාලකිරීම හෝ නොකළ යුතුයි.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්යසාධනයට, එනම්:— පන්සල මාවත පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ (203 පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් පලාත් පාලන කාරක සභාවට ලැබී තිබෙන බලය නිසා එම කාරක සභාවෙන් නිසියාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 1,396. ගම—කටුකුරුන්ද හා කුඩා හිනටියන්ගල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මාදන්ගහවත්ත, කොළඹ පාරේ වරිපනම් අංක 287, 288 සහ 288A දරණ ඉඩම්වල කොටස් | අවුරුදු දෙකක් වයසැති පොල්පැල 3ක්ද, අවුරුදු 3–15 දක්වා වයසැති පුවක්ගස් 4ක්ද, 20–40 හැවිරිදි කොස්ගස් තුනක්ද, 40 හැවිරිදි අඹගසක්ද, 10 හැවිරිදි මුරුංගා ගහක්ද, 30 හැවිරිදි කොහොඹගහක්ද, 3 හැවිරිදි දෙඹපැල 2ක්ද, උළුසෙවිලි කපරාරු කළ ගොඩනැගිල්ලකින් කොටසක්ද, තාවකාලික කක්කුස්සියක්ද ඇති ඉඩම | කටුකුරුන්දේ පදිංචි පිටිගලආචාරිගේ පබෝහාමි, මොරමුදලිගේ වලෝසිංඤෝඅප්පුහාමි, බිනරගමවිදානලාගේ එඩ්වඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ එඩ්මන්ඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ මැගී ද සිල්වා, බිනරගමවිදානලාගේ ලෝරන්ස් ද සිල්වා සහ බිනරගමවිදානලාගේ ස්ටැන්ලි ද සිල්වා | 0 0 7·3 |
| 2 | මාදන්ගහවත්ත, කොළඹ පාරේ වරිපනම් අංක 287, 288 සහ 288A දරන ඉඩම්වල කොටස් | 40 හැවිරිදි පොල්ගස් 2ක්ද, 6–10 හැවිරිදි පොල්පැල 5ක්ද, 40 හැවිරිදි කොස්ගහක්ද, 30 හැවිරිදි පුවක්ගස් 4ක්ද, 6 හැවිරිදි පුවක්පැල 5ක්ද, 30 හැවිරිදි රබර්ගස් 5ක්ද, 40 හැවිරිදි කල්ගහක්ද, 40 හැවිරිදි දෙඹගහක්ද, 40 හැවිරිදි අඹගහක්ද, 3 හැවිරිදි දෙහිගහක්ද, 8 හැවිරිදි දෙල්ගහක්ද ඇති ඉඩම | බිනරගමවිදානලාගේ එඩ්වඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ එඩ්මන්ඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ මැගී ද සිල්වා, බිනරගමවිදානලාගේ ලෝරන්ස් ද සිල්වා, බිනරගමවිදානලාගේ ස්ටැන්ලි ද සිල්වා සහ මොරමුදලිගේ වලෝසිංඤෝ අප්පුහාමි සහ පිටිගලආචාරිගේ පබෝහාමි, සියල්ලෝම කටුකුරුන්දේ | 0 0 14·4 |
| 3 | අඩිපාර (නොම්මරයක් නැත) | අඩිපාර .. .. | එම .. .. | 0 0 0·5 |
| 4 | මාදන්ගහවත්ත, කොළඹ පාරේ වරිපනම් නො. 287, 288 සහ 288A දරණ ඉඩම්වල කොටස් | මුඩුබිම .. .. | එම .. .. | 0 0 0·2 |
| 5 | කිරිගෙවත්තේ පාවුල, කොළඹ පාරේ 287, 288 සහ 288A දරණ වරිපනම් නොම්මර ඇති ඉඩම්වල කොටස් | 4–10 හැවිරිදි පොල්ගස් 7ක්ද, 4–8 හැවිරිදි කොස්ගස් 5ක්ද, 6 හැවිරිදි රබර් ගහක්ද ඇති ඉඩම | මොරමුදලිගේ වලෝසිංඤෝ අප්පුහාමි, බිනරගමවිදානලාගේ එඩ්වඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ එඩ්මන්ඩ් ද සිල්වා, බිනරගමවිදානලාගේ මැගී ද සිල්වා, බිනරගමවිදානලාගේ ලෝරන්ස් ද සිල්වා සහ බිනරගමවිදානලාගේ ස්ටැන්ලි ද සිල්වා, සියල්ලෝම කටුකුරුන්දේ පදිංචිව සිටිති | 0 0 3·4 |
| 6 | කොළඹ පාරේ වරිපනම් අංක 298 සහ 298A දරණ ගෙමිබිගොඩ කුරුඳුවත්ත කියන ඉඩමේ කොටස් | 50 හැවිරිදි පොල්ගස් දෙකක්ද, 30 හැවිරිදි පුවක්ගහක්ද, 4 හැවිරිදි රබර් ගහක්ද, 15 හැවිරිදි රඹුටන්ගහක්ද ඇති ඉඩම | ගාල්ලගේ රොස්ලින් ප්‍රනාන්දු, ගාල්ලගේ සෙලෙස්තිනා ප්‍රනාන්දු, ගාල්ලගේ පමිස්තිනා ප්‍රනාන්දු, ගාල්ලගේ බෙමෝ ප්‍රනාන්දු, ගාල්ලගේ අගිස්තීනු ප්‍රනාන්දු සහ දේමපුරගේ එයුජින්, සියල්ලෝම කුඩා හිනටියන්ගල | 0 0 1·6 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ දෙසැම්බර් මස 12වෙනි දින උදේ 10.30ට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයිඅන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 16වෙනි දින කළුතර කච්චේරියේදීය.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මයිත.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාර්යසාධනයට, එනම්:— ඉත්තපාන ව්‍යාපාරය යටතේ කහාගෙන සහ පොතුකුඹුරේ වෙල්යායට කරදිය එම වැලැක්වීම පිණිස කානු කැපීම සහ ඇලකන්ද බැඳීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැණීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැණීමේ ආඥාපත්‍රයේ (203 පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කර තිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසියාකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. F. V. P. 78වේ නො. 3 අතිරේක පැත. ගම—ඉත්තැපාන.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 332 | ඇත්තොටුවේකැරුව .. | මුඩුබිම .. | අයිතිවාසිකමකියන්නෙක් දැනගන්නට නැත .. | 0 0 14 |
| 333 | එම .. | එම .. | එම .. .. | 0 0 17 |

එබැවින් ඉඩම් අයිතිකරගැණීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1942ක්වූ දෙසැම්බර් මස 12වෙනි දින උදේ 11ට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒවා ඇත්තාවූ තමුන්ගේ අයිතියේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1942ක්වූ නොවැම්බර් මස 16වෙනි දින කළුතර කච්චේරියේදීය.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්ත මයිත.

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3න් ආඥාපත්‍රයේ හයවෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කාර්‍ය්‍යසාධකට, ඒනම්:— හෑබඩ නගරය දියුණුකිරීමට සහ පහත් බිම් ප්‍රදේශය ගොඩකොට ප්‍රයෝජනගැනීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ (203 පරිච්ඡේදයේ)" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් පලාත් පාලන කාරක සභාවට ලැබී තිබෙන බලය නිසා, එම කාරක සභාවෙන් නියියාකාර මට අණලැබී ඇත, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 1,460. ගම—පහල හෑබඩ (කොටසක)

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 1 | වරිපනම් අංක 10 දරණ ඉඩමේ කොටසක්, සනීපාරක්ෂක සභාවේ වෙළඳපොළ | කපරාරුකල ගොඩනැගිල්ලක් සහ කාණු සහිත මුඩුබිම | සීමාසහිත රෝජර්ස්(ලංකාවේ)රබර් සමාගම (ගොඩනැගිල්ලට සහ කාණුවලට කළුතර සනීපාරක්ෂක සභාව අයිතිවාසිකම්කියයි) | 0 | 0 | 8·75 |
| 2 | කලබන්වත්ත, වරිපනම් අංක 7 දරන ඉඩමේ කොටසක් | තුන්හැවිරිදි පුවක්ගහක්ද, සමහක් වයස්වූ කෙසෙල්පඳුරු 2ක්ද ඇති ඉඩම | සීමාසහිත රෝජර්ස්(ලංකාවේ)රබර් සමාගම | 0 | 0 | 2·31 |
| 3 | කබලන්වත්ත (වරිපනම් අංකයක් නැහැ) | තිස්හැවිරිදි රබර්ගස් 16ක්ද, කොස් ගසක්ද, අඹගස් 10ක්ද, කිතුල්ගස් 2ක්ද, රඹුටන්ගසක්ද (සියල්ලම තුන්හැවිරිදි) ඇති ඉඩම | එම .. | 0 | 1 | 1·86 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1942ක්වූ දෙසැම්බර් මස 12වෙනි දින උදේ 11.30ට කළුතර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑමා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියා සිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ නොවැම්බර් මස 16වෙනි දින
කළුතර කච්චේරියේදීය.

ජී. ආර්. ඩබ්ලිව්. ද සිල්වා,
ආණ්ඩුවේ අතිරේක උප ඒජන්තවරයා.

---

වම් 1876ක්වූ අවුරුද්දේ නොම්බර 3න් ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කාර්‍ය්‍යසාධකට, ඒනම්:— ආණ්ඩුවේ ඉඩමකට සම්බන්ධකිරීම පිණිස පුද්ගලික ඉඩමක් උඩින් කරත්තපාරක් වෙනස්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "ආණ්ඩුවට ඉඩම් ලබාගැනීමේ ව්‍යවස්ථාවේ" 5වෙනි වගන්තියේ කරතිබෙන සංශෝධනවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නියියාකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩම්නම්:—

අතිරේක සිතියමේ නො. 3, අවසාන සිතියමේ නො. 631. ගම—සෝදකන්ඩිය.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. | රූ. | ප. |
|---|---|---|---|---|---|---|
| 198 | පන්සලවත්ත .. | පහත් කැලේ .. | සෝදකන්ඩියේ බෝධිමලු විහාරස්ථානයේ පදිංචි කේ. විපස්සි තේරෝ | 0 | 0 | 10·2 |
| 199 | එම .. | එම .. | එම .. .. .. | 0 | 0 | 11·3 |
| 200 | එම .. | එම .. | එම .. .. .. | 0 | 0 | 10·3 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා පස්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම හෝ නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වම් 1942ක්වූ දෙසැම්බර් මස එකොළොස්වෙනි දින සවස 3ට තිස්ස කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑමා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වම් 1942ක්වූ නොවැම්බර් මස 17වෙනි දින
හම්බන්තොට කච්චේරියේදීය.

සී. සිත්තම්පලම්,
ආණ්ඩුවේ උප ඒජන්තවරයා.

---

## අන්‍ය දැන්වීමයි.

කොළඹ දිස්ත්‍රික්කයේ සියනෑකෝරලේ මැදපත්තුවේ අලුත්ගම-ගම්පහ පදිංචි කුරුප්පුආරච්චිගේ ගාර්ලින් ශ්‍රීමති යන මම, මාතර දිස්ත්‍රික්කයතුළ සිංහල භාෂාවෙන් වැඩකරන ප්‍රසිද්ධ නොතාරිස් කෙනෙකු හැටියට පත්කරනු ලැබීම පිණිස මෙවක් පටන් තුන්මාසයක් ගතවූවායින් පසු රෙජිස්ට්‍රාර් ජනරාල්තුමාගෙන් ඉල්ලුම්කරන බව 91වෙනි පරිච්ඡේදයේ නොතාරිස් ආඥාපනතේ 1B ඈඹුල්පත්‍රයේ 2වෙනි වගන්තියේ ප්‍රකාර මෙයින් දැනුම්දෙමි.

බන්ඩාරවත්ත, ගම්පහ.
ඔක්තෝබර් 10, 1942.

කේ. ඒ. ගාර්ලින් ශ්‍රීමති.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.